# මුතුකිගේ කුඩය



කර්තෘ
ඩබ්.ඒ. විනුදි සෙහන්සා වික්‍රමසිංහ

# මුතුකිගේ කූඩය

කර්තෘ

**ඩබ්.ඒ. විනුදි සෙහන්සා වික්‍රමසිංහ**

# මුතුකිගේ කුඩය

කථාව සහ චිත්‍ර :

**ඩබ්.ඒ. විනුදි සෙහන්සා වික්‍රමසිංහ**

**පළමු දිගහැරුම**

| | | |
|---|---|---|
| **පාසල** | : | මහාමායා බාලිකා විදුහල |
| **ඉගෙනුම ලබන පංතිය** | : | 6 වසර A |
| **කෘතිය පළ කරන දිනය** | : | 2026.06.06 |
| **ISBN** | : | 978-624-211-361-6 |

# පිදුම

මෙම පොත ලිවීමට

මා හට මග පෙන්වූ

මාගේ විදුමව්

මහාමායා මෑණියනි,

ඔබට බැති සිතින්

පුදමි මෙම පොත .....



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන "හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය" නම් කළ හැකි ය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

**ශශිකලා සේනාධීර,**
**විදුහල්පතිනිය,**
**මහාමායා බාලිකා විද්‍යාලය.**

# සුභාශිංසන පණිවිඩය



මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.

සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි.

එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආර්ශවාදය පිරිනමමි.

මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සරත් බී.එස්. අභයකෝන්,**
**ආණ්ඩුකාරවර, මධ්‍යම පළාතඳ**
**සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**
2026-05-10

# සුභාශිංසන පණිවිඩය



වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ප්‍රදීප් නිලංග දෑල,**
**දියවඩන නිලමේ,**
**ශ්‍රී දළදා මාලිගාව.**
2026-05-10

# මුතුකිගේ කුඩය

මුතුකි කියන්නේ පුංචි ගැහැනු ළමයෙක්. මුතුකි විපතකට පත්වුණු කෙනෙට කවදාවත්ම උදව් කළේ නැහැ. ඒ වගේ ම මුතුකි එයාට අයිති දේවල් අන්අයට අල්ලන්න දුන්නෙ නැහැ.

"මුතුකි, ඔයාගේ මකනය හරිම ලස්සනයි. මම ඒක බලන්න ද?" මුතුකිගේ යාළුවෝ එයාගෙන් අහනවා.

"ඔයාලා මගේ මකනය ගන්න එපා" එවිට මුතුකි තරහෙන් කියනවා.



එතකොට යහළුවන්ට ගොඩක් දුක හිතෙනවා. මේ හින්දා කරවුරුත් ම මුතුකිට කැමති වුණේ නැහැ.

අද ගොඩක් විශේෂ දවසක්. අද මුතුකිගේ උපන් දිනය. අක්කා එයාට ලස්සන කතන්දර පොතක් තෑගි දුන්නා. අම්මාගෙන් මුතුකිට ලස්සන ගවුමක් තෑගි ලැබුණා.



මේ වගේ තෑගි ගොඩක් සීයාගෙන්, ආච්චිගෙන්, නැන්දාගෙන්, මාමාගෙන් වගේ ම යාළුවන්ගෙනුත් මුතුකිට ලැබුණා. ඒ තෑගිවලින් එයා කැමති ම තෑග්ග වුණේ තාත්තා එයාට දුන්න පුංචි කුඩය.




ඉතින් මුතුකි මේ කුඩයට කොච්චර ආදරෙයි ද කිව්වොත් එයා යන හැම තැන ම කුඩේ අතේ තිබුණා. මුතුකි මේ කුඩය ඉස්කෝලෙට අරගෙන ගියා. යාළුවන්ට පෙන්නුවා. ඒත් අල්ලන්න නම් දුන්නේ නෑ.



මුතුකි ඉස්කෝලේ ඇරිලා යනකොට මේ පුංචි කුඩය ඉහළගෙන ගෙදර ගියා. ඒත් අව්වවත් වැස්සවත් තිබුණේ නැහැ. මුතුකි කුඩය ඉහළ ගෙන ගියේ අනිත් අයට පෙනෙන්න.

මුතුකි මේ කුඩය හැමදාම හොඳින් පිරිසිදු කළා. එයා නිදාගන්න ගියත් එයාගේ කුඩය කොට්ටය ළඟ තිබුණා.



වෙලාවකට නම් මුතුකි අම්මාගෙන් බැණුම් අහනවා."මුතුකි දැන් ඔයා කුඩය එක්කමයි. ගිහින් පාඩම් කරන්න. නැත්තං මේ කුඩය වෙන ළමයෙකුට දෙනවා." එවිට මුතුකි අකමැත්තෙන් පාඩම් කරනවා.



දවසක් මුතුකි කුඩයත් අරගෙන ඉස්කෝලේ ගියා. හවස ඉස්කෝලේ ඇරිලා එනකොට හොඳට ම වහින්න පටන් ගත්තා. මුතුකි කුඩය ඉහළන් ගෙදර යන්න ලෑස්ති වෙද්දි, "මුතුකි, මට කුඩය ගෙනෙන්න බැරි වුණා. මමත් ඔයාගේ කුඩේ යටින් යන්න ආවට කමක් නැද්ද?" මුතුකිගේ යාළුවෙක් වන කුමුදු ඇහුවා.

"එපා ඔයා මගේ කුඩේ යටින් එන්න" මුතුකි කිව්වා.



පසුදාත් මුතුකි ඉස්කෝලේ ගියා. එයාට එදා කුඩේ අරගෙන යන්න අමතක වුණා. ඉස්කෝලේ ඇරිලා හොඳට ම වහින්න පටන් ගත්තා.

මුතුකි කුඩය නැති නිසා දුකින් පැත්තකට වී සිටියා. කුමුදු මේක දැකලා මුතුකි ළඟට ඇවිත්, "මුතුකි, එන්න මගේ කුඩේ යටින් යමු." කිව්වා. මුතුකිට ගොඩක් ලැජ්ජා හිතුණා.



"මට සමාවෙන්න කුමුදු. ඊයේ මම කරපු දේට." මුතුකි කුමුදුගෙන් සමාව ඉල්ලුවා.

"ඒකට කමක් නෑ මුතුකි" කුමුදු කිව්වා.



එදා පටන් මුතුකි අන් අයට උදව් කරමින් හොඳ ළමයෙක් වුණා.

# නිමි



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.

පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

**සෙනෙවිරත්න මහලේකම්**
**ව්‍යාපෘති නිර්මාතෘ**
**සම්බන්ධීකාරක**

ISBN : 978-624-211-361-6